᠎# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2034/35 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81(XII)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

23 ද වගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන වන මම, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අයිතම හැර මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කටයුතු තහනම් කිරීමට මෙයින් නියම කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

I වන උපලේඛනය

කටයුතු :

(i) දේශීය භාවිතය සඳහා වැඩි ඝනත්වයෙන් යුතු පොලිඑතිලින් අමුද්‍රව්‍යයක් වන යම් මලු නිෂ්පාදනය ; සහ

(ii) වැඩි ඝනත්වයෙන් යුතු පොලිඑතිලින් අමුද්‍රව්‍යයක් ලෙස යොද නිෂ්පාදිත යම් මලු රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය.

මෙම උපලේඛනයේ කාර්ය සඳහා වැඩි ඝනත්වයෙන් යුත් පොලිඑතිලින් අමුද්‍රව්‍යයක් ලෙස යොදා නිෂ්පාදිත මලු යන්නෙන්, ''සිලි සිලි බෑග් '' වශයෙන් පොදුවේ හඳුන්වනු ලබන පාරිභෝගිකයන්ගේ මලු ද ඇතුළුව නිෂ්පාදන හෝ භාණ්ඩ රැගෙන යාමේ කාර්ය සඳහා අතළු සහිත හෝ රහිත වන කුමන හෝ පරිමාණයකින් යුතු මලු අදහස් වේ.

## II වන උපලේඛනය

නිදහස් කරන ලද අයිතම ඃ

(1) පහත සඳහන් පරිමාණයෙන් හෝ ඊට ඉහළ පරිමාණයෙන් යුත් කසළ බහාලුම් මලු ඃ

දිග - මිමී 600
පළල - මිමී 260
උස - මිමී 900

(2) පහත සඳහන් පරිමාණයෙන් හෝ ඊට ඉහළ පරිමාණයෙන් යුත් රෙදිපිළි බහාලුම් මලු ඃ

දිග - මිමී 400
උස - මිමී 500

09-363

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.